*සැ. යු.* - (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,075 - 2018 ජූනි මස 08 වැනි සිකුරාදා - 2018.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1248 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1266 |


*සැ. යු.* -(i) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූනි මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු - කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මැයි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | වෙල්ලවීදිය | කොළඹ (කොච්චිකඩේ ප්‍රදේශය) කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ. |

06-516

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
### රෙජිස්ට්‍රාර් තනතුරු - ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මැයි මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | අත්තනගල්ල | නැගෙනහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ එගොඩපොත උතුර අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-518

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ භාෂාවෙන් උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු - අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මැයි මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | කල්මුණ දෙමළ | කරවාහුපත්තු කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| අම්පාර | කල්මුණ දෙමළ | නට්පට්ටිමුනයි කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කරවාගුපත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

06-517

## ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව

### ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා පහත සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා විවෘත පදනම මත සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.06.19 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා බඳවා ගැනීම'' යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ. විශ්‍රාම ගන්නා තෙක් මෙම තනතුරේ රැඳී සිටිය යුතුයි. රාජකාරි සේවා ස්ථානය ශ්‍රේෂ්ඨාධිකරණය - තනතුරු සංඛ්‍යාව 01.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩුව සඳහා පත් කරනු ඇත.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි* :
ඉදිරියේදී රජය විසින් ගනු ලබන තීරණවලට යටත්ව ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය.

03. *වැටුප් පරිමාණය* : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ 111, 11 හා 1 වන ශ්‍රේණියට අදළ මාසික වැටුප් පරිමාණය PL-1-2016-රු.24,250/- 10x250-10x270-10x300-12x330-රු. 36,410 වේ.

04. *සුදුසුකම්* :-

4.1 *අධ්‍යාපන සුදුසුකම්* :-
අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02ක් ඇතුළුව විෂයයන් 06ක් සමත්ව තිබීම.

4.2 *වෘත්තීය සුදුසුකම්*.-විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

4.3 *පළපුරුද්ද*.-විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

05. *වයස් සීමාව*.-2018.06.19 වැනි දිනට වයස අවු. 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

(දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

06. *වෙනත් සුදුසුකම්* :-

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය,

(*ආ*) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය,

(*ඇ*) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටියක රීතින්හි V වැනි පරිච්ඡේදය අනුව රාජ්‍ය සේවයට පත් කිරීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය*.-ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනන දිනයේ ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින්, සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු

ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතේ සඳහන් කළයුතු අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන පරිපාටිය පහත පරිදි වේ.

| | *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ. |
| 02. | වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03. | භාෂා දැනුම | 10 | |
| 04. | පරිගණක දැනුම | 15 | |
| 05. | පළපුරුද්ද | 40 | |
| 06. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි, නායකත්වය, පෞරුෂත්වය, සංනිවේදන කුසලතා | 05 | |
| | එකතුව | 100 | |

*සටහන* - තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳව, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුයි.

08. *රාජ්‍ය භාෂා ප්‍රවීනතාව* :-

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීනතාව* |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02. අනෙකුත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ වන මට්ටමේ භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය. |

09. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

11. අයදුම්පත් බහා එවන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා බඳවා ගැනීම." යන්න සඳහන් කරන්න.

12. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ණ නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය පිළිබඳ නිකුත්කර ඇති චක්‍රලේඛය ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ප්‍රදීප් මහමුතුගල,
රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය.

2018 මැයි මස 24 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියට බඳවා ගැනීම**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

සේවය කිරීමට මනාපය දක්වන අමාත්‍යාංශය :————.

දෙපාර්තමේන්තුව :————.

අයදුම්කරන තනතුර :————.

1. මුලකුරු සමඟ නම :————.
2. සම්පූර්ණ නම :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය
4. ස්ථිර ලිපිනය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0
6. උපන් දිනය : වර්ෂය මාසය දිනය
7. දුරකථන අංකය
8. අධ්‍යාපන සුදුසුකම් :

(i) පළමුවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(ii) දෙවන වර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂයය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.1 අ. පො. ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

09. වෙනත් සුදුසුකම් :

10. තනතුර අදාළව ලබා ඇති පළපුරුද්ද :————.

11. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :————.

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-542

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති සහකාර තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම - 2018

### Recruitment to Posts of Legal Assistant of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති සහකාර තනතුරෙහි පවතින පුරප්පාඩු 17 ක් (දහහතක්) සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 අගෝස්තු මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.මේ සඳහා කැමැත්තක් දක්වන අයදුම්කරුවන් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද සිය අයදුම්පත් 2018.07.11 දිනට හෝ ඊට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "නීති සහකාර තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.07.11 වේ.

*සටහන* :- අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය*.-යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් පමණ වේ.

1.1 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

- මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)
- මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක(03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන(03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
- එසේම II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා 01/2014 ද ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර පහක් (05) ඇතුළත ලබාගත යුතුය.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :-
මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු.31,490 -10x445 -11x660-10x730 -5x750 - රු.54,250/-

(වැටුප් කේත අංකය - MN 4 - 2016)
මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය. 2018.01.01 දිනට මූලික වැටුප රු.24,980/- සහ රු. 3,278/- ක ගැළපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

04. *අවශ්‍ය සුදුසුකම්* :-

අධ්‍යාපන සුදුසුකම් :-

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

වයස් සීමාව : 2018.07.11 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.
(ඒ අනුව 1997.07.11 දින හෝ ඊට පෙර හා 1983.07.11 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්කරු හෝ පවුලේ අයෙකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට *ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙම තනතුරට සුදුසුකම් ලබන අයවලුන්හට පත්වීම් ලබාදීමට පෙර කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය දැයි සොයා බැලීමට ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳවනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* ః

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ. :-

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **භාෂා ප්‍රවීනතාවය** ః<br>■ මව් භාෂාවට අමතරව හදාරා ඇති වෙනත් භාෂාවක් පිළිබඳ පශ්චාත් උපාධිය - ලකුණු 20<br>■ මව් භාෂාවට අමතරව හදාරා ඇති වෙනත් භාෂාවක් පිළිබඳ උපාධියක් - ලකුණු 15<br>■ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයකින් හදාරා ඇති මව් භාෂාව හැර වෙනත් භාෂාවක් පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 10<br>■ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයකින් හදාරා ඇති මව් භාෂාව හැර වෙනත් භාෂාවක් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 20 | අදාළ නොවේ |
| **පරිගණක සාක්ෂරතාවය**<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා - ලකුණු 15<br>■ රජයේ පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 10<br>■ රජයේ පිළිගත් ආයතනයක මාස 03 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 15 | |
| **අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම්** ః<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් සඳහා - ලකුණු 20<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 10<br>■ රජයේ පිළිගත් ආයතනයක පාඨමාලා කාලසීමාව වසරකට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 20 | |
| **පර්යේෂණ නිබන්ධන හා විෂය විශ්ලේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද** ః<br>තනතුරට සුදුසුකම් ලැබීම සඳහා වන උපාධියට නොවන වෙනත් අවශ්‍යතාවයක් වෙනුවෙන් වන පර්යේෂණ නිබන්ධන හෝ විෂය විශ්ලේෂණ වාර්තා 01 ක් සඳහා ලකුණු 10 බැගින්<br>(උපරිම ලකුණු 20) | 20 | |
| **විෂය බාහිර ක්‍රියාකාරකම්** ః<br>ජාතික මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 20<br>පළාත් මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 10<br>දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 05 | 20 | |
| **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය** ః<br>අපේක්ෂකයාගේ හැසිරීම සහ සන්නිවේදන හැකියාව පිළිබඳව සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |

06. අයදුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි භාවිතා කරමින් 01 සිට 07 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය *ගැසට්* නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

6.1 අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.
(i) අධ්‍යාපන සහතික
(ii) උප්පැන්න සහතිකය
(iii) ජාතික හැඳුනුම්පත
(iv) පළපුරුද්ද පිළිබඳ සහතික
(v) චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් විය යුතුය.)

*සැලකිය යුතුයි* :

- ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

07. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු.415,260 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2018 මැයි මස 31 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36, මලලසේකර මාවත,කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති සහකාර තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම - 2018**

***Recruitment to Posts of Legal Assistant of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018***

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය :
2 - සිංහල
3 - දෙමළ
4 - ඉංග්‍රීසි

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
උදා :- NIMAL A.B.C.D. :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසියෙන්) :————.

03. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. (i) ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (කැඳවීම් ලිපිය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
(ii) රාජකාරී ලිපිනය : (රාජ්‍ය සේවයේ නියුක්ත නම්) :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]

07. ජනවර්ගය : [ ] (සිංහල -1, දෙමළ-2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම්-4, වෙනත්-5)

08. උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

2018.07.11 දිනට වයස : අවු. [ | ] මාස [ | ] දින [ | ]

09. දුරකතන අංකය : ජංගම | | | | | | | | | | |
ස්ථාවර | | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් :

*අ.පො.ස. (සා.පෙළ)*

| *විෂයය* | *සාමාර්ථ්‍ය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *සාමාර්ථ්‍ය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

*අ.පො.ස.(උ.පෙළ)*

| *විෂයය* | *සාමාර්ථ්‍ය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11. නීති උපාධි පාඨමාලාව :————.
 විශ්ව විද්‍යාලය :————.
 උපාධිය පිළිබඳ විස්තර :————.

 වෙනත් සුදුසුකම් :
 1. ————.
 2. ————.
 3. ————.

12. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධුරය හැරගිය අයකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද ඃ
 ඔව්/ නැත :————.

13. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද? :————.

 පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**

.......................... පදිංචි .......................... නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2018 ........ මස........ දින ................... දී ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන

නම හා පදවි නාමය :————.
ලිපිනය :————.

නිල මුද්‍රාව :————.

දිනය :————.

*සටහන* - දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඃ-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
..................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

06-626

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ නිලධාරි තනතුරුවලට නිලධාරින් බඳවා ගැනීම - 2018

## Recruitment to Posts of Corruption Prevention officers of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ නිලධාරි තනතුරෙහි පවතින පුරප්පාඩු 50 (පනහ) සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 අගෝස්තු මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ සඳහා කැමැත්තක් දක්වන අයදුම්කරුවන් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද සිය අයදුම්පත් 2018.07.11 දිනට හෝ ඊට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "දූෂණ නිවාරණ නිලධාරි තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.07.11 වේ.

*සටහන.*- අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.*-යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 50 ක් පමණ වේ.

1.1 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

- මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

- එසේම II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා 01/2014 ද ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර පහක් (05) ඇතුළත ලබාගත යුතුය.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු.31,490 -10x445 -11x660-10x730 -5x750 - රු.54,250/-

(වැටුප් කේත අංකය - MN 4 - 2016)
මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය. 2018.01.01 දිනට මූලික වැටුප රු.24,980/- සහ රු. 3,278/- ක ගැළපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

04. අවශ්‍ය සුදුසුකම් :

අධ්‍යාපන සුදුසුකම් :

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

වයස් සීමාව : 2018.07.11 දිනට වයස අවු 21 ට නොඅඩු සහ අවු 35 ට නොවැඩි විය යුතුය.
(ඒ අනුව 1997.07.11 වැනි දින හෝ ඊට පෙර හා 1983.07.11 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වියයුතුය.

වෙනත් සුදුසුකම් :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;
- අයදුම්කරු හෝ පවුලේ අයෙකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය;
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට *ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය;
- මෙම තනතුරට සුදුසුකම් ලබන අයවලුන්හට පත්වීම් ලබාදීමට පෙර කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය දැයි සොයා බැලීමට ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳවනු ලැබේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මඟින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛපරීක්ෂණයක් මඟින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ. :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **භාෂා ප්‍රවීනතාවය**<br>■ මව් භාෂාවට අමතරව හදාරා ඇති වෙනත් භාෂාවක් පිළිබඳ පශ්චාත් උපාධිය - ලකුණු 20<br>■ මව් භාෂාවට අමතරව හදාරා ඇති වෙනත් භාෂාවක් පිළිබඳ උපාධියක් - ලකුණු 15<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයකින් හදාරා ඇති මව් භාෂාව හැර වෙනත් භාෂාවක් පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 10<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයකින් හදාරා ඇති මව් භාෂාව හැර වෙනත් භාෂාවක් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 20 | අදාළ නොවේ |
| **පරිගණක සාක්ෂරතාවය**<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා - ලකුණු 15<br>■ රජයේ පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 10<br>■ රජයේ පිළිගත් ආයතනයක මාස 03 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 15 | |

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම්**<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් සඳහා - ලකුණු 20<br>■ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 10<br>■ රජයේ පිළිගත් ආයතනයක පාඨමාලා කාලසීමාව වසරකට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම සඳහා - ලකුණු 05<br>(සුදුසුකම් ලැබීමේ උපාධියට අමතරව විය යුතුය.) | 20 | |
| **පර්යේෂණ නිබන්ධන හා විෂයය විශ්ලේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද**<br>තනතුරට සුදුසුකම් ලැබීම සඳහා වන උපාධියට නොවන වෙනත් අවශ්‍යතාවයක් වෙනුවෙන් වන පර්යේෂණ නිබන්ධන හෝ විෂයය විශ්ලේෂණ වාර්තා 01 ක් සඳහා ලකුණු 10 බැගින්<br>උපරිම ලකුණු 20) | 20 | |
| **විෂයය බාහිර ක්‍රියාකාරකම්**<br>ජාතික මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 20<br>පළාත් මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 10<br>දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා හා අනෙකුත් කුසලතා සඳහා - ලකුණු 05 | 20 | |
| **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>අපේක්ෂකයාගේ හැසිරීම සහ සන්නිවේදන හැකියාව පිළිබඳව සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |

06. අයදුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි භාවිතා කරමින් 01 සිට 07 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළයුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය *ගැසට් නිවේදනයට* යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

6.1 අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

(i) අධ්‍යාපන සහතික
(ii) උප්පැන්න සහතිකය
(iii) ජාතික හැඳුනුම්පත
(iv) පළපුරුද්ද පිළිබඳ සහතික
(v) චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් විය යුතුය.)

සැලකිය යුතුයි :

■ ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

07. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රු.415,260 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

11. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2018 මැයි මස 31 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
අංක 36, මලලසේකර මාවත,කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ නිලධාරි තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම - 2018**

*Recruitment to Posts of Corruption Prevention officers of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018*

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය :

2 - සිංහල
3 - දෙමළ ☐
4 - ඉංග්‍රීසි

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
උදා :- NIMAL A.B.C.D. :————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම: (ඉංග්‍රීසියෙන්) :————.

03. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. (i) ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (කැඳවීම් ලිපිය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
(ii) රාජකාරී ලිපිනය : (රාජ්‍ය සේවයේ නියුක්ත නම්) :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1

07. ජනවර්ගය : ☐ (සිංහල -1, දෙමළ-2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම්-4, වෙනත්-5)

08. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

2018.07.11 දිනට වයස :

| අවු. | මාස | දින |
|---|---|---|
| | | |

09. දුරකතන අංකය : ජංගම

ස්ථාවර

10. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා.පෙළ) :

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙළ) :

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11. උපාධි පාඨමාලාව :————.
විශ්ව විද්‍යාලය :————.
උපාධිය පිළිබඳ විස්තර :————.

වෙනත් සුදුසුකම් :
1. ————.
2. ————.
3. ————.

12. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැරගිය අයකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද :
ඔව්/ නැත :————.

13. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද? :————.

පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

.......................... පදිංචි .......................... නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2018 ........ මස........ දින ................... දී ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන

නම හා පදවි නාමය :————.

ලිපිනය :————.

නිල මුද්‍රාව :————.

දිනය :————.

සටහන - දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :-

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

..................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

06-625

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරී තනතුරට නිලධාරීන් බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2018

### Open Competitive Examination for Recruitment to the Post of Investigation Officer of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු 200 (දෙසීයක්) සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 සැප්තැම්බර් මස කොළඹ, නුවර, මාතර, කුරුණෑගල, කිලිනොච්චිය හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එසේම යම් දිස්ත්‍රික්කයක අපේක්ෂිත මට්ටමට අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති වීම හෝ වෙනත් කරුණක් මත අපේක්ෂකයන් ආසන්නතම විභාග මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2018.07.10 දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "විමර්ශන නිලධාරී තනතුර සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.07.10 වේ.
*සටහන*.- අයදුම්පත හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය*.-ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 200 ක් පමණ වේ.

1.1 මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

- මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

- මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක(03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන(03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

- එසේම II ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා 01/2014 ද ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම තනතුරට පත්වී වසර පහක් (05) ඇතුළත ලබාගත යුතුය.

- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය :
රු.34,605-10x660-11x755-15x930 - රු.63,460/-
(වැටුප් කේත අංකය - MN 5 - 2016)
මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය. 2018.01.01 දිනට මූලික වැටුප රු.33,290/- සහ රු.1,052/- ක ගැලපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

04. *අවශ්‍ය සුදුසුකම්* :
අධ්‍යාපන සුදුසුකම් :
(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;
හෝ
(*ආ*) ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතීඥයකු වීම.

වයස් සීමාව : 2018.07.10 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවු 35 ට නොවැඩි විය යුතුය.
(ඒ අනුව 1997.07.10 දින හෝ ඊට පෙර හා 1983.07.10 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. )

කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට *ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙම තනතුරට සුදුසුකම් ලබන අයවලුන්හට පත්වීම් ලබාදීමට පෙර කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය දැයි සොයා බැලීමට ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳවනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

5.1 ලිඛිත විභාගය : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| විෂය අංකය | විෂයයන් | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම | ක්‍රීඩා, අන්තර් ජාතික සංවිධාන, තොරතුරු තාක්ෂණය, ඉතිහාසය, අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති ඔහුගේ/ඇයගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 | 100 | 40% |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සන්දර්භයක් තුළ ඉදිරිපත් කරන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 02 | 100 | 40% |
| 03 | රචනය හා සාරාංශය | දෙන ලද මාතෘකාවන් හෝ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින්ම තෝරාගන්නා ලද තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ලියවිල්ලක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව සහ නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමට මෙයින් අදහස් කරයි. | පැය 02 | 100 | 40% |

5.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **වෘත්තීය සුදුසුකම්**<br>■ රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. (ඕනෑම විෂයයක පාඨමාලාවකට ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10 )<br>■ පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවකට (ලකුණු 3 බැගින් උපරිම ලකුණු 12)<br>■ පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම විෂයයක් යටතේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 10) | 20 | අදාළ නොවේ. |
| **පළපුරුද්ද**<br>පිළිගත් ආයතනයක වෘත්තීය පළපුරුද්ද වසරකට ලකුණු 10 බැගින් උපරිම ලකුණු 20 | 20 | |
| **බාහිර කුසලතා**<br>ක්‍රීඩා හා සමාජීය ක්‍රියාකාරකම් | 20 | |
| **ස්වයං විඥාණය ඇගයීම**<br>විමර්ශන විෂයය හා සම්බන්ධ සිද්ධි අධ්‍යයනයක් ආශ්‍රිතව සකස් කරන ලද කෙටි ලිඛිත පරීක්ෂණයක් පවත්වා එයින් අයදුම්කරුවන්ගේ විමර්ශන කුසලතාවය මැන බලනු ලැබේ. (මූලික බඳවා ගැනීමේ විභාගය සමත් වූ අයදුම්කරුවන් අතර) | 20 | |
| සන්නිවේදන හැකියාව හා පෞරුෂය | 10 | |
| වෙනත් භාෂා හැකියාව | 10 | |

5.3 ලිඛිත පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා එහිදී ලබා ගන්නා ලකුණු සහ ලිඛිත පරීක්ෂණයේ ලකුණු යන දෙකෙහිම එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

06. අයදුම්පත සෙ.මී.22-29 ප්‍රමාණයේ A4 කඩදාසි භාවිතා කරමින් 01 සිට 07 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

6.1 අපේක්ෂකයාගේ අනන්‍යතාව :-
අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.
(i) අධ්‍යාපන සහතික,
(ii) උප්පැන්න සහතිකය,
(iii) ජාතික හැඳුනුම්පත,
(iv) පළපුරුද්ද පිළිබඳ සහතික,
(v) චරිත සහතික දෙකක් ( මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතුය.)

*සැලකිය යුතුයි* :

(*අ*) ඉල්ලුම් කරනු ලබන තනතුර/තනතුරු අයදුම්පතේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

(*ආ*) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුරට බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක දින හෝ කාල වකවානුවලින් තොරව සේවයේ යොදවනු ලැබේ.

07. *විභාග ගාස්තු* : විභාග ගාස්තුව රු.750 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් , උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. අයදුම්කරුවන් නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. *විභාගයට පෙනී සිටීම* :

8.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු /විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රු.415,260/- කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාග යට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 ලිඛිත පරීක්ෂණයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් මුළු ලකුණු කුසලතාව අනුව සුදුසුකම් ලැබුවන්ගේ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම" වෙත ලබාදෙනු ඇත. ලිඛිත පරීක්ෂණයට පෙනීසිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් දැන්වීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. results. exams. gov. lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත.

8.3 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.4 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2018 මැයි මස 31 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

***අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරී තනතුරට නිලධාරීන් බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2018***

Open Competitive Examination for Recruitment to the Post of Investigation Officer of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

විභාගයට පෙනී සිටින නගරය :

| | *නගර* | *නගරය අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය -1 අනුව සම්පූර්ණ කරන්න)

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය
2 - සිංහල
3 - දෙමළ
4 - ඉංග්‍රීසි

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :
උදා :- NIMAL A.B.C.D. :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසියෙන්) :————.

03. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. (i) ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (ප්‍රවේශ පත්‍රය ලිපිය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
(ii) රාජකාරි ලිපිනය : (රාජ්‍ය සේවයේ නියුක්ත නම්) :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1

06. ජාතික හැඳුනුම්පත් අංකය :

07. ජනවර්ගය : (සිංහල -1, දෙමළ-2, ඉන්දියානු දෙමළ-3, මුස්ලිම්-4, වෙනත්-5)

08. උපන් දිනය :

වර්ෂය මාසය දිනය

2018.07.10 දිනට වයස ඃ

| | | |
|---|---|---|
| අවු. | මාස | දින |

09. දුරකතන අංකය ඃ ජංගම

ස්ථාවර

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

අ.පො.ස.(සා.පෙළ)

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙළ)

| විෂයය | සාමාර්ථ්‍ය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11. උපාධි පාඨමාලාව :————.
විශ්ව විද්‍යාලය :————.
උපාධිය පිළිබඳ විස්තර :————.

වෙනත් සුදුසුකම් ඃ
1. ————.
2. ————.
3. ————.

12. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධුරය හැරගිය අයකු ලෙස සලකනු ලැබූ කෙනෙක් ද ඃ
ඔව්/ නැත :————.

13. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද? :————.

පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ඃ
ආයතනය :————.
මුල් පත්වීමේ දිනය :————.
තනතුර :————.
වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.
(i) :————.
(ii) :————.

16. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
    (i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
    (ii) ලදුපත් අංකය හා දිනය :————.
    (iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |
|---|

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය හා නිවැරදි බව, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... පදිංචි .......................... නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, 2018 ........ මස........ දින .................... දී ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

නම හා පදවි නාමය :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.

————,
අත්සන.

*සටහන* .-දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :-

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ස්ථිර/තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.
(අනවශ්‍ය වචන කපා හරින්න)

උපලේඛන අංක 01

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| මාතර | 03 |
| කුරුණෑගල | 04 |
| කිලිනොච්චිය | 05 |
| ත්‍රිකුණාමලය | 06 |

06-627

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

1.0 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය , සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (අ). උපලේඛන අංක III හි සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමේදී, සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා සම්මුඛ පරික්ෂණයකින් පසු තෝරාගනු ඇත. විභාගය, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. ඔහුගේ තීරණය අවසන් තීරණය වනු ඇත. විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම දක්වා ඇත.

(ආ) බඳවා ගනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

3.0 භාෂා මාධ්‍යය:- මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.0 සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :

(i) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2053/18 සහ 2018.01.09 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම ව්‍යවස්ථාවට මින්මතු කෙරෙන සංශෝධන වලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලටද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු අතර, එය තනතුරේ ස්ථිර කිරීම සඳහා වන කොන්දේසියකි.

(iii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරාගනු ලබන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කිරීමට යටත් වේ.

(iv) මෙම පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයයෙන්ම සේවය කල යුතුය. කෙසේ වෙතත් පත් කිරීමේ බලධරයා විසින් තීරණය කරන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත් කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(v) රාජ්‍ය භාෂාව - රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියෙකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය. දෙවන රාජ්‍ය භාෂාව - පත්වීම් ලැබ වසර පහක් (05) ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍ර ලේඛවල විධිවිධාන අනුව ඒ පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(vi) රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී වේලාව අවුරුද්දේ සියලුම දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ. එහෙත් රාජකාරී අවශ්‍යතාවය මත හා රාජකාරී ස්වාභාවය අනුව ඉහත වේලාවන් වෙනස් විය හැක. තවද රාත්‍රී සේවයේ යෙදීම අනිවාර්ය වන අතර, රාජකාරී ස්වාභාවය අනුව අමතර රාජකාරී සඳහාද නියෝග කරනු ලැබිය හැකිය. එමෙන්ම වසරේ දින තුන්සිය හැට පහේම (365) සේවයට යටත් වනු ඇත.

(vii) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරන රාජකාරී ඉටු කරන මෙම නිලධාරීන් විසින් රුපියල් 5000/- ක ඇප තැන්පතු මුදලක් තැබිය යුතුය.

(viii) සේවා අවශ්‍යතාවය අනුව සෞඛ්‍ය ආයතන හා රෝහල්වල සේවයේ නියුතු නිලධරයන් සෙනසුරාදා හා ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීමට නියම කළ හැක. ඒ වෙනුවට අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා ගත හැක.

5.0 *වැටුප්*.-අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47,990 ක් වන අතර එම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිට වේ. වැටුප් කේත අංකය MN-02- 2016 වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම් ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. රු. 31940/= වැටුප් පියවරේන් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීමද, රු. 35790/= වැටුප් පියවරෙන් ඔබ්බට යාම සඳහා I ශ්‍රේණියට උසස් වීමද ලබා ගතයුතුය. මීට අමතරව රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

6.0 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුවේ. තවද වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුවේ. මේ සම්බන්ධව රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

7.0. මෙම තනතුරට අයදුම් කිරීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබියයුතුය. :

7.1. මූලික සුදුසුකම්:

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(*ඇ*) විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.
(*ඈ*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

7.2. අධ්‍යාපන සුදුසුකම් :

(1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රිසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් (03) එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

*සැ.යු.*- සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2018 .04.30 වැනි දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරාගැනීම :

(*අ*) දිස්ත්‍රික් නාම ලේඛනය උප ලේඛන 1 ලෙස දක්වා ඇත. පුරප්පාඩු සඳහා තරඟ කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උප ලේඛන 1 අනුව අයදුම් පත්‍රයේ නිවැරදිව සඳහන් කළ යුතුය.

(*ආ*) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කරනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම්කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කරගත නොහැකි වන විට කුසලතා අනුපිළිවලින් සුදුස්සන් තෝරනු ලැබේ.

(iii) විභාගයේදී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ

(*ඇ*) *දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම්*.- දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරඟ කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයෙකු විය යුතුය.
එසේ, *නැතහොත්,*

(ii) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙන් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතුය.
එසේ *නැතහොත්,*

(iii) ඔහු නොකඩවා අවුරුදු තුනක් (03) එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

***සටහන.***- යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව රජයේ , පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටී නම්, එම අපේක්ෂකයාට තම මව

හෝ පියා හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ.(ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රාජ්‍ය සේවයේ නිරත වන බැව් සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.)

ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

(i) උප්පැන්න සහතිකය;

(ii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය හෝ අවුරුදු 03 ක අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාම ලේඛනය,

(iii) ශිෂ්‍ය කාර්ය දර්ශන;

(iv) කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි අයදුම්පතෙහි සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

9.0. විභාග පරිපාටිය -:

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි මාධ්‍යයෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | ලකුණු | කාලය |
|---|---|---|
| (i) භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2යි |
| (ii) අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

*භාෂා හැකියාව*.-මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, රාජකාරි ලිපියක් කෙටුම්පත්කිරීම, ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*අභියෝග්‍යතාව*.-මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

**සටහන -**

(අ) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචන වල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ඇ) මෙම විභාගය තරග විභාගයක් වුවද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සීයයට හතලිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාග යේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ලබා ගත යුතු වේ. බඳවා ගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඈ) *විභාග ප්‍රතිඵල*.-අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් www.health.gov.lk යන නිල වෙබ් අඩවිය මඟින් පල කිරීම සිදු කෙරෙනු ඇත.

10.0. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වීමේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0. විභාග ගාස්තු :

**විභාග ගාස්තුව රු. 800/= කි.** මෙම මුදල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ රැස් කිරීමේ ගිණුම් අංක 7041318 යටතේ බැරවන පරිදි ලංකා බැංකු ශාඛාවකට පමණක් ගෙවිය යුතුය. විභාග ගාස්තු ගෙවන ලද එම ලදුපත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතුවේ. (විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ඔබ විසින් ලඟ තබාගත යුතු වේ.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

12.0. අයදුම්කිරීම සහ අයදුම්පත් එවිය යුතු පිළිවෙල :

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෑම අයදුම්කරුවකු/අයදුම්කාරියක් විසින්ම A 4 ප්‍රමාණයේ (සෙ.මී. 21 x 29) කඩදාසි භාවිතා කරමින්, 01 සිට 02 දක්වා ඡේදයන් පළමු පිටුවටද, අංක 03 සිට 06 දක්වා වන ඡේදයන් දෙවන පිටුවටද, ඉදිරියට වන ඡේදයන් තුන්වන පිටුවටද, ඇතුලත් වන පරිදි පිටු 03 කින් මුද්‍රණය කර ගත යුතුය.

(ii) එසේ පිළියෙල කර ගන්නා ලද අයදුම්පත්‍රය විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන්ම සම්පූර්ණ කළයුතු අතර ඉල්ලුම් පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවරේ ''රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය"- 2018 ............. (ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය සඳහන් කරන්න) යනුවෙන් සඳහන් කර 2018.07.06 දිනට ප්‍රථම ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය (පුද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය) අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ලඟ තබාගන්නේ නම් වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

*සැ.යු.*- (i) **විභාගයට පෙනී සිටීමට යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයන් ගණනක් නොසිටියහොත් යාබද නගරය වෙත යොමු කරනු ලැබේ.විභාගය පවත්වන නගරය පිළිබඳ අවසාන තීරණය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.**

(ii) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම් පත්‍රයේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුලත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

(iii) විභාගය සඳහා වූ අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන මෙම නිවේදනයේ 13ඃ (ඇ) හි සඳහන් තත්වයක් දරන අයෙකු ලවා සහතික කර තිබිය යුතුය.

(iv) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති නියමිත විභාග ගාස්තුව ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් යොමු කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙසට සලකුණු නොලැබේ. *ගැසට් නිවේදනය* අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සදහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එහිදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 විභාගයට පෙනී සිටීම :

(*අ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මගින් දැනුවත් කරනු ඇත. නිවේදනය පළ වී දින 05 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විභාග අංශය වෙත දන්වා සිටිය යුතුය.

(*ආ*) එහිදී ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපතද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද සඳහන් කරමින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විභාග අංශයෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද හා ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් 0112698763 ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටිම වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

(*ඇ*) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සමාදාන විනිශ්චකාරවරයකු , දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥ වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රු.240360/- හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයකු ලවා හෝ සහතික කරවා ගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය. **එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.**

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කීරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

15.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම

සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

ජනක සුගතදාස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය.

2018ක් වූ මැයි මස 23 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2018

Open Competitive Examination for Recruitment to Grade III of
Public Health Management Assistant's Service - 2018

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

විභාගයට පෙනී සිටින මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

■ *ගැසට් නිවේදනයේ* 9.0 ඡේදයට අනුකූලව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය සඳහන් කරන්න (දිස්ත්‍රික් අංක සහිත උපලේඛන - I බලන්න. අදාළ දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න) :

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|
| | |

■ *ගැසට් නිවේදනය* අනුව, ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කයේ විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන නගරය හා නගර අංක 02 ක් ඇතුළත් කරන්න (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක සඳහා උපලේඛන - II බලන්න) :

| නගරය | නගර අංකය |
|---|---|
| | |
| | |

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : FERNANDO D.B.S.K.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : පැරණි ☐☐☐☐☐☐☐☐☐☐
නව ☐☐☐☐☐☐☐☐☐☐☐☐

1.4 විවාහක අවිවාහක බව :————.

1.5 ජාතිය :————.

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය - පුරුෂ - M ස්ත්‍රී - F ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2018.04.30 දිනට වයස :

වර්ෂය : ☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.4 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද ? :————.

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය :————.

(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විෂයය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය :————.

(ii) විභාග අංකය :————.

(iii) විෂයය ධාරාව :————.

(iv) ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න. ඔව් නම් විස්තර සඳහන් කරන්න)
---------------------

--------------------- ඔව් ☐ නැත ☐

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ
(i) විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව :————.
(ii) ලදුපත අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |
|---|

8.0 අයැදුම්කරුගේ ප්‍රකාශය ඃ

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරාගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................ ............ මයා/මෙනෙවිය/මහත්මිය මා පෞද්ගලික දන්න හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ....................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

### උපලේඛනය - 01

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| | | |
|---|---|---|
| 01. | කොළඹ | 01 |
| 02. | ගම්පහ | 02 |
| 03. | කළුතර | 03 |
| 04. | මාතලේ | 04 |
| 05. | මහනුවර | 05 |
| 06. | නුවරඑළිය | 06 |
| 07. | ගාල්ල | 07 |
| 08. | මාතර | 08 |
| 09. | හම්බන්තොට | 09 |
| 10. | යාපනය | 10 |
| 11. | මන්නාරම | 11 |
| 12. | මුලතිව් | 12 |
| 13. | වව්නියාව | 13 |
| 14. | ත්‍රිකුණාමලය | 14 |
| 15. | මඩකලපුව | 15 |
| 16. | අම්පාර | 16 |
| 17. | පුත්තලම | 17 |
| 18. | කුරුණෑගල | 18 |
| 19. | අනුරාධපුර | 19 |
| 20. | පොළොන්නරුව | 20 |
| 21. | බදුල්ල | 21 |
| 22. | මොණරාගල | 22 |
| 23. | කෑගල්ල | 23 |
| 24. | රත්නපුර | 24 |
| 25. | කිලිනොච්චිය | 25 |

### උපලේඛනය - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරයන්

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 01. කොළඹ | කොටහේන | 01 |
| | මරදාන | 02 |
| | බොරැල්ල | 03 |
| | කුරුදුවත්ත | 04 |
| | බම්බලපිටිය | 05 |
| | හැව්ලොක් ටවුන් | 06 |
| | නුගේගොඩ | 07 |
| | මොරටුව | 08 |
| | පිළියන්දල | 09 |
| | මහරගම | 10 |

| දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|
| | හංවැල්ල | 11 |
| | අවිස්සාවේල්ල | 12 |
| | හෝමාගම | 13 |
| 02. ගම්පහ | මීගමුව | 14 |
| | මිනුවන්ගොඩ | 15 |
| | දිවුලපිටිය | 16 |
| | වේයන්ගොඩ | 17 |
| | ගම්පහ | 18 |
| | ජා- ඇල | 19 |
| | වත්තල | 20 |
| | කැළණිය | 21 |
| | දොම්පේ | 22 |
| 03. කළුතර | හොරණ | 23 |
| | පානදුර | 24 |
| | කළුතර | 25 |
| | මතුගම | 26 |
| | අලුත්ගම | 27 |
| 04. මාතලේ | මාතලේ | 28 |
| | ගලේවෙල | 29 |
| | නාඋල | 30 |
| | ලග්ගල - පල්ලෙගම | 31 |
| 05. මහනුවර | මහනුවර | 32 |
| | කටුගස්තොට | 33 |
| | තෙල්දෙණිය | 34 |
| | වත්තේගම | 35 |
| | නුගවෙල | 36 |
| | ගලගෙදර | 37 |
| | ගම්පොල | 38 |
| 06. නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | නුවරඑළිය | 40 |
| | වලපනේ | 41 |
| | හැටන් | 42 |
| | ගිනිගත්හේන | 43 |
| 07. ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | ගාල්ල | 45 |
| | බද්දේගම | 46 |
| 08 මාතර | වැලිගම | 47 |
| | මාතර | 48 |
| | කඹුරුපිටිය | 49 |
| | හක්මන | 50 |
| | දෙයියන්දර | 51 |
| | දික්වැල්ල | 52 |
| | අකුරැස්ස | 53 |
| | කොටපොළ | 54 |
| 09. හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | වලස්මුල්ල | 56 |
| | වීරකැටිය | 57 |
| | තංගල්ල | 58 |
| | අම්බන්තොට | 59 |
| | හම්බන්තොට | 60 |
| | තිස්සමහරාම | 61 |
| 10. යාපනය | චාවකච්චේරි | 62 |
| | යාපනය | 63 |
| | තෙලිප්පල්ලෙයි | 64 |
| | පේදුරුතුඩුව | 65 |
| 11. මන්නාරම | මන්නාරම | 66 |
| | මුරුක්කන් | 67 |
| 12. මුලතිව් | මුලතිව් | 68 |
| 13. වවුනියාව | වවුනියාව | 69 |
| 14. ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | ත්‍රිකුණාමලය | 71 |
| | මුතූර් | 72 |
| | පදවි පරාක්‍රමපුර | 73 |
| | කින්නියා | 74 |
| 15. මඩකලපුව | මඩකලපුව | 75 |
| | එරාවූර් | 76 |
| | කාත්තන්කුඩි | 77 |
| 16. අම්පාර | අම්පාර | 78 |
| | සේරංකඩ | 79 |
| | කල්මුණ | 80 |
| | අක්කරේපත්තු | 81 |
| | සමන්තුරේ | 82 |
| 17. පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | මාදම්පේ | 84 |
| | හලාවත | 85 |
| | පුත්තලම | 86 |
| 18. කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | බිංගිරිය | 88 |
| | නාරම්මල | 89 |
| | පොල්ගහවෙල | 90 |
| | කුරුණෑගල | 91 |
| | ඉබ්බාගමුව | 92 |
| | දොඩම්ගස්ලන්ද | 93 |
| | නිකවැරටිය | 94 |
| | මහව | 95 |

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 19. අනුරාධපුර | මැදවච්චිය | 96 |
| | කැකිරාව | 97 |
| | අනුරාධපුර | 98 |
| | ගලෙන්බිඳුණුවැව | 99 |
| | කහටගස්දිගිලිය | 100 |
| 20. පොළොන්නරුව | පොළොන්නරුව | 101 |
| | හිගුරක්ගොඩ | 102 |
| 21. බදුල්ල | බණ්ඩාරවෙල | 103 |
| | වැලිමඩ | 104 |
| | බදුල්ල | 105 |
| | පස්සර | 106 |
| | මහියංගනය | 107 |
| | ගිරාඳුරුකෝට්ටේ | 108 |
| | හසලක | 109 |
| 22. මොණරාගල | බිබිල | 110 |
| | මොණරාගල | 111 |
| | වැල්ලවාය | 112 |
| 23. කෑගල්ල | කෑගල්ල | 114 |
| | රඹුක්කන | 115 |
| | මාවනැල්ල | 116 |
| | රුවන්වැල්ල | 117 |
| 24. රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | රත්නපුර | 119 |
| | පැල්මඩුල්ල | 120 |
| | බලංගොඩ | 121 |
| | කලවාන | 122 |
| | ඇඹිලිපිටිය | 123 |
| 25. කිළිනොච්චිය | කිළිනොච්චිය | 124 |
| | පලෙයි | 125 |

## උපලේඛන III

### පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු දිස්ත්‍රික්කයන්

| *දිස්ත්‍රික්කය* | *පවතින පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. කොළඹ | 473 |
| 02. ගම්පහ | 32 |
| 03. කළුතර | 12 |
| 04. මාතලේ | දිස්ත්‍රික්කය තුළ පුරප්පාඩු නැත. |
| 05. මහනුවර | 42 |
| 06. නුවරඑළිය | 16 |
| 07. ගාල්ල | 28 |
| 08. මාතර | 11 |
| 09. හම්බන්තොට | 12 |
| 10. යාපනය | 23 |
| 11. මන්නාරම | දිස්ත්‍රික්කය තුළ පුරප්පාඩු නැත. |
| 12. මුලතිව් | දිස්ත්‍රික්කය තුළ පුරප්පාඩු නැත. |
| 13. වව්නියාව | දිස්ත්‍රික්කය තුළ පුරප්පාඩු නැත. |
| 14. ත්‍රිකුණාමලය | 20 |
| 15. මඩකලපුව | 13 |
| 16. අම්පාර | 27 |
| 17. පුත්තලම | 03 |
| 18. කුරුණෑගල | 16 |
| 19. අනුරාධපුර | 62 |
| 20. පොළොන්නරුව | 15 |
| 21. බදුල්ල | 08 |
| 22. මොණරාගල | 08 |
| 23. කෑගල්ල | 07 |
| 24. රත්නපුර | 09 |
| 25. කිළිනොච්චිය | දිස්ත්‍රික්කය තුළ පුරප්පාඩු නැත. |

06-460

---

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා දන්ත කාර්මික ශිල්පී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2018

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ දන්ත කාර්මික ශිල්පී තනතුරට අදාළව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨය මගින් පවත්වනු ලබන දන්ත කාර්මික පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාල සීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1 | දන්ත කාර්මික ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |

02. පුහුණු පාඨමාලාවට පළාත් වලින් බඳවා ගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් පළාත් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පුහුණුවට බඳවාගනු ලබන සංඛ්‍යාව - 10)

03. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. යමෙකු එසේ අයදුම් කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඔවුන් පහත දක්වෙන ආකාරයට ක්‍රියා කළ යුතුය.

3.1 2018.06.29 දින වන විට කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්, මෙම පුහුණු පාඨමාලාව සඳහා තේරී පත්වුවහොත් එම පාඨමාලාව සඳහා ලියාපදිංචි කරන දිනට පෙර අදාළ පුහුණුවෙහි හෝ පාඨමාලාවෙහි ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුවද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය උක්ත පරිදි අවලංගු කර ගත යුතුය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතුය.

3.2 2018.06.29 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් පුහුණුව සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු/ ඇය පුහුණුවේ ලියාපදිංචි වීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතුය.

3.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතුය.

3.4 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත් වුවහොත් ඒ වන විට ලබමින් සිටි පුහුණුවට අදළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

*සැලකිය යුතුයි* :

* ඉහත 3.1 සිට 3.4 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණද අනිවාර්යයෙන්ම ඔබ මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් <u>නොකෙරෙන</u> බව ඔබ තරයේ සිහි තබා ගත යුතුය.

* එම 3.1 සිට 3.4 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

* එමෙන්ම, ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණද, 3.1 සිට 3.4 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම්, කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතුය.

04. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | දන්ත කාර්මික ශිල්පී | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2016 සහ 2017 වර්ෂයේ දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් <u>රසායන විද්‍යාව</u> විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) එක්වරකදී සමත්වීම | නැත |

05. අනෙකුත් පොදු සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඇ) පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 10 ක් වත් සේවය කිරීමට කැමති විය යුතුය.

(ඈ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඉ) තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

I. 2018.06.29 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් තුළ ඔහු/ ඇය එම දිස්ත්‍රික්කය තුළ අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය. (මෙහි දී ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය).;

හෝ

II. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03 ක ඡන්දහිමි නාම ලේඛනවල උපුටන ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතෙහි 1 සිට 9 (අ) දක්වා පළමු පිටුවේ ද, 9 (ආ) සිට 12 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය.

(ආ) අයදුම්පතෙහි "ලදුපත" යන ස්ථානයේ ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට රුපියල් 300/- ක මුදල බැර කර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් ලබා ගන්න.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/ රජයේ විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 452,916/- කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අදාළ ආකෘති පත්‍රය අමුණා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ "අතුරු වෛද්‍ය සේවාවේ දන්ත කාර්මික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම 2018" යනුවෙන් සඳහන් කර, ඊට පහළින් ඔබ ඉල්ලුම් කරන පළාත හා දිස්ත්‍රික්කය සඳහන් කොට 2018.06.29 දිනට පෙර, අධ්‍යක්ෂ (පරිපාලන- ආයතනික), සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ - 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

07. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

08. අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2018.06.29 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා වෙනත් අමාත්‍යාංශයක මාණ්ඩලික නිලධාරියෙකුගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය.),

(ඇ) අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය.),

(ඈ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.,

(ඉ) ඉහත 5 (ඊ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන.

10. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

11. පුහුණු කිරීමේ පරිපාටිය :

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතුරින් තෝරා ගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් දන්ත කාර්මික පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දන්ත කාර්මික පුහුණු පාසලට ඇතුළත් කරනු ලැබේ. පුහුණුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.

II. පුහුණු පාසලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසැලේ බල පැවැත්වෙන නීතිරීති වලට හා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

IV. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළදී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

V. පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ/ පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත් ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් දන්ත කාර්මික තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට/ ඇයට ගෙවන ලබන දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඔහු/ ඇය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

12. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාලව බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පවත්නා

මනාපය හා පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදළ තනතුරේ III පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදනය කළහොත් MT-6-2016 ද, වැටුප් පරිමාණ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි රු. 32,080-445x10-660x11-730x10-750x10=58,590/= වැටුප් ගෙවනු ලැබේ.

13. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළදී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඔහුගෙන්/ ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

14. තෝරාගත් අයදුම්කරුවන් අදළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

15. ඉහත පරිදි බඳවාගන්නා ලද සියළුම දෙනා රජයේ සේවකයින්ට අදළ වන සියළුම නීතිරීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට , සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලටද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත් වනු ඇත.

16. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසලේ නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

17. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදළ තනතුරේ පත්වීම් ලදහොත්, ඉන්පසුවද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

18. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ මා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

ජනක සුගතදාස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2018.05.25 වැනි දින,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ-10.

ආදර්ශ අයදුම්පත්‍රය

අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා දන්ත කාර්මික ශිල්පී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2018
(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න.)

1\. (*අ*) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : A. B. C. SILVA
(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐ (පිටපතක් අමුණන්න.)

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
.......................... ..........................
.......................... ..........................
.......................... ..........................
.......................... ..........................

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
.......................... ..........................
.......................... ..........................
.......................... ..........................
.......................... ..........................

(ආ) දුරකථන අංක :- ජංගම ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද ? (ඔව්/නැත) :————.

(ඉ) ''ඔව්'' නම් කොපමණ කලක පටන් ද ? :————.

5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

2018.06.29 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

උස : අඩි :————. අඟල් :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

9. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (උ.පෙළ) විභාගය ( Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :————.
විභාගයට පෙනී සිටි වර්ෂය :————. විභාග අංකය :————.
Z අගය :————. විෂය ධාරාව :————.
විභාගයට පෙනී සිටි මාධ්‍යය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*

| අනු. අංකය | විෂය | පළමුවර | | දෙවන වර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | | වර්ෂය | |
| | | විභාග අංකය | | විභාග අංකය | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව/දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

* ඔබ විසින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සඳහා පෙනී සිටි සියලු විෂයයන් ඉහත වගුවෙහි සඳහන් කළ යුතු වේ.

10. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් නම් විස්තර සපයන්න. :
.....................................................................................................................................
.....................................................................................................................................

11. *අයදුම්කරුගේ සහතිකය* :-

(*අ*) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසි වලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරු හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බවද මම දන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය .................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

* තනතුර :————.
* ලිපිනය :————.

06-605

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.